# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,445 - 2025 ජුලි මස 11 වැනි සිකුරාදා - 2025.07.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 244 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 247 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 01 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජුලි මස 18 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඬිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

243 - B 082699 - 353 (2025/07)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එරංගා මදුමාලි ගීගන ගමගේ මහානාම වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986 මාර්තු මස 18 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/4035 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු තමාඩුව පදිංචි වික්‍රම ආරච්චිගේ එඩ්වින් වෙත ප්‍රදානය කොට තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1648 යටතේ 1987.05.12 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (වර්තමානයේ ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ) උතුරු ගිරුවා පත්තුවේ, නැගෙනහිර කඩිගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තමාඩුව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබූ අ. ග. පි. 240 දරන පිඹුරෙහි අංක 158 දරන කැබැල්ල වන ප්‍රමාණයෙන් අක් : 01 යි පර්චස් 08 ක් විශාලත්වය ඇති, පහත පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : බජ්ජමහේන්යාය

*උතුරට* : ලොට් 157 දරන බිම් කැබැල්ල ද,
*නැගෙනහිරට* : ලොට් 148 දරන ප්‍රවේශ මාර්ගය ද,
*දකුණට* : ලොට් 163 දරන ප්‍රවේශ මාර්ගය ද,
*බස්නාහිරට* : ලොට් 159 දරන බිම් කැබැල්ල ද.

එරංගා මහානාම,
ප්‍රාදේශීය ලේකම්,
ඕකෙවෙල.

2025 අප්‍රේල් මස 10 වැනි දින.

07 - 599/1

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණවීර ආරච්චිගේ චතුරි දමිත්‍රා වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988 ඔක්තෝබර් මස 04 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/13306 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කටුවන, රණසිංහගොඩ පදිංචි කුඩාඅන්තෝනිගේ ධනවතී වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ...... යටතේ ....... වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර ගිරුවා පත්තුවේ, රණසිංහගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රණසිංහගොඩ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අවසාන ගම් පිඹුරු අංක 151 දරන රේඛා සටහනේ අංක 179 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.105 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම :

*උතුරට* : අංක 148 දරන බිම් කැබැල්ල ද,
*නැගෙනහිරට* : අංක 178 දරන බිම් කැබැල්ල ද,
*දකුණට* : අංක 182 දරන බිම් කැබැල්ල ද,
*බස්නාහිරට* : අංක 180 දරන බිම් කැබැල්ල ද වේ.

ආර්. ඒ. චතුරි දමිත්‍රා,
ප්‍රාදේශීය ලේකම්,
කටුවන.

2024 දෙසැම්බර් මස 04 වැනි දින.

07 - 599/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කේ. ජී. ඩී. අනෝජා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.13 දින ප්‍රදානය කර ඇති අංක මා/4/ප්‍ර/20534 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කනංකෙ කඩවීදිය, තෙපුදෙනිය, සෙම්ඩෙල් ගොවිපල පදිංචි උඩුවක වඩු ආචාරිගේ ප්‍රියන්ති වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 535 යටතේ 1996.01.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ නිමලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නිමලව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, රූඩ් 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : සෙම්ඩෙල් වත්ත.

| | |
|---|---|
| *උතුරට* | : ටී. ජී. පියදාසගේ ඉඩම (මා/අ/නි/371/349), |
| *නැගෙනහිරට* | : බී. බබහාමි *නොහොත්* බේබිහාමිගේ ඉඩම (මා/අ/නි/371/291), |
| *දකුණට* | : පී. ජී. ජේම්ස්ගේ ඉඩම (මා/7/නි/371/429), |
| *බස්නාහිරට* | : ජයවීරගේ අමරපාලගේ ඉඩම (මා/අ/නි/371/293) |

කේ. ජී. ඩී. අනෝජා,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2025 අප්‍රේල් මස 03 වැනි දින.

07 - 647

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

ඌව පළාත් සභාවේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් වීරසිංහ මුදියන්සේලාගේ චමින්ද වීරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2007.05.16 දින ප්‍රදානය කර ඇති අංක බදු/ප්‍ර 50986 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බදුල්ල, ඉඹුල්ගොඩ, මීගහවත්ත පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ කුමාරිහාමි වෙත ප්‍රදානය කොට බදුල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L. D. O H. A 06/22 යටතේ 2007.09.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ, ඉඹුල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉඹුල්ගොඩ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, බදුල්ල දිස්ත්‍රික්කයේ, මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 82 දරන පිඹුරේ අංක 238 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0921 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ග්ලේන් ඇල්පින් වත්ත රොක්හිල් කොටස.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 239 සහ 237, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 237, 228 සහ 250, |
| *දකුණට* | : කැබලි අංක 249 සහ 247, |
| *බස්නාහිරට* | : කැබලි අංක 247, 242 සහ 239. |

ඩබ්. එම්. සී. වීරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හාලිඇල.

2024 ජූලි මස 18 වැනි දින.

07 - 650

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඇළබොඩ ගෙදර උපාලි රාජපක්ෂ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.06.23 දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/2842 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය, දකුණු ඉවුර යාය 02 පදිංචි සුදුදේවගේ කුලරත්න වෙත ප්‍රදානය කොට අනුරාධපුරය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 381 යටතේ 1983.04.19 දින 12/3157 පිටුවේ ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

උතුරුමැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, දකුණු නුවරගම් පළාත, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එප්පාවල කෝරළයේ 7 ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රොටවැව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 09 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. සි. 434 දරන රේඛා සටහනෙහි අංක 1089 කුඹුර දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 (එක), රූඩ් 03 (තුන), පර්චස් 38 (තිස්අට) විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : රොටවැව.

*උතුරට* : පාර,
*නැගෙනහිරට* : අංක 1088 කණ්ඩිය රක්ෂිතය,
*දකුණට* : අංක 1091 රොටවැව ඇල රක්ෂිතය,
*බස්නාහිරට* : 1090 කුඹුරු ඉඩම.

ඊ. ජී. යූ. රාජපක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2025 මාර්තු මස 19 වැනි දින.

07 - 651/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඇළබොඩ ගෙදර උපාලි රාජපක්ෂ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.06.07 දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/1815 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය, දකුණු ඉවුර යාය 05 පදිංචි අමරතුංග ආරච්චිලාගේ එරමෝනිස් සිංඤෝ වෙත ප්‍රදානය කොට අනුරාධපුරය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1820 යටතේ 1982.08.12 දින දනුප/1/1858 පිටුවේ ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

උතුරුමැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, දකුණු නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එප්පාවල කෝරළයේ රාජාංගනය ජනපදයේ, 7ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අංගමුව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 04 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. සි. 439 දරන රේඛා සටහනෙහි අංක 344 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 (එක), පර්චස් 35 (තිස්පහ) විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : අංගමුව මූකලාන

*උතුරට* : කැබලි අංක 330 පාර,
*නැගෙනහිරට* : කැබලි අංක 343 ගොඩ ඉඩම,
*දකුණට* : කැබලි අංක 350 ගොඩ ඉඩම,
*බස්නාහිරට* : කැබලි අංක 345 ගොඩ ඉඩම.

ඊ. ජී. යූ. රාජපක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2025 මාර්තු මස 07 වැනි දින.

07 - 651/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/72786.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* EP/28/LB/LS/BAT/MN/37.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 176 ඩී, පනිච්චයඩි ග්‍රාම නිලධාරි වසමේ, සතුරුක්කොන්ඩාන් ගමේ ප්‍රමාණයෙන් පිපි/මඩ/1284 දරන පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 8.1912 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස ක්‍රීඩා කටයුතු සඳහා මඩකලපුව දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : Road, |
| *නැගෙනහිරට* | : Road, State Land |
| *දකුණට* | : State Land, Road, |
| *බටහිරට* | : Private Land, Road |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.05.23 සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

වාර මුදල : අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ක්‍රීඩා කටයුත්තක් සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* බද්ද ක්‍රියාත්මක දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූනි මස 25 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 595

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/77709.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NCP/PLC/L11/04/නොච්/දී:කා.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 337, මුදිතාගම ග්‍රාම නිලධාරි වසමේ, හිරිපිටියාගම ගමේ, ඉඩම් නිලධාරි විසින් අඳින ලද අංක NOC/LND/CROWN/337/29 දරන දළ අනුරේඛනයේ කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 01, පර්. 22.4 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා දොන් ප්‍රසන්න කන්නන්ගර මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : රජයේ ඉඩම, |
| *නැගෙනහිරට* | : අතුරු පාර රක්ෂිතය හා අතුරු පාර, |
| *දකුණට* | : රජයේ ඉඩම, |
| *බටහිරට* | : රජයේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.05.23 දින සිට 2055.05.22 දක්වා);

*වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂි කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2025.05.23 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජුනි මස 24 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 596

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/53546.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංක :* EP/28/LB/LS/TRI/T&G/191.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 244 ආර් ලිංග නගර් ග්‍රාම නිලධාරි වසමේ, ලිංග නගර් ගමේ එප්වීපී 15 පිඹුරේ කැබලි අංක 2788 හි දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0123 ක් වූ රජයේ ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා අල් මස්ජිතුත් තක්වා ජුම්මා පල්ලියේ භාරකාර මණ්ඩලය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි 2789, |
| *නැගෙනහිරට* | : පාර (PS), |
| *දකුණට* | : කැබලි 2789, |
| *බටහිරට* | : කැබලි 2789 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.05.23 දින සිට 2055.05.22 දක්වා);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ආගමික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2025.05.23 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූනි මස 23 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 597

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/78060.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංක :* EP/28/LB/L-10/LS/TRI/MOR/22.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 230 සී නොච්චිකුලම ග්‍රාම නිලධාරි වසමේ, නොච්චිකුලම, තිරියාය හන්දිය ගමේ අංක 9603 අනුරේඛනයේ, කැබලි අංක 28 සහ 30 හි දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 02 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා පොල්පිටි ආරච්චිගේ නිලන්ත පුෂ්ප කුමාර නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

කැබලි අංක 28 හි මායිම් -

| | |
|---|---|
| *උතුරට* | : ඇළ, |
| *නැගෙනහිරට* | : ඇළ, |
| *දකුණට* | : ඇළ, |
| *බටහිරට* | : අංක 9594 පිඹුරේ කැබලි අංක 29. |

කැබලි අංක 30 හි මායිම් -

| | |
|---|---|
| *උතුරට* | : ඇළ, |
| *නැගෙනහිරට* | : ඇළ, |
| *දකුණට* | : ත්‍රිකුණාමලය අනුරාධපුර ප්‍රධාන මාර්ගය, |
| *බටහිරට* | : අංක 9594 පිඹුරේ කැබලි අංක 31. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.05.23 දින සිට 2055.05.22 දක්වා);

*වාර්ෂික බදු මුදල .-* 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ රුපියල් මිලියන පහක (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත්කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2025.05.23 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජුනි මස 23 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 598